# වාකරේ - සල්ලතිවු දූපතෙහි සිදුවන නීති විරෝධී සංචාරක කටයුතු

සුවිශේෂී පොහොසත් ජෛවවිවිධත්වයක් සහිත මෙම සල්ලතිවු දූපත පිහිටා තිබෙන්නේ ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාතේ මඩකලපුව දිස්ත්‍රික්කයේ ය. එය ආසන්න වශයෙන් මීටර් 275ක් දිගින් ද මීටර් 155ක් පළල් වන අතර මෙය ප්‍රධාන භූමියට විවිධ මෝසම් අවස්ථා වලදී මීටර් 250ක් පමණැති වැලි පරයක් මගින් සම්බන්ධ වේ.

මෙහිදී හදුනා ගෙන ඇති සියලුම ශාක වර්ග, එනම් ශාක වර්ග 50ක් පමණ ශ්‍රී ලංකාව තුල දේශීයව හදුනාගෙන ඇති ශාක වර්ග වන අතර, ජාතික ලෙස තර්ජනයට ලක් වූ එක් ශාක වර්ගයක් ද මෙහි අඩංගු වන අතර, තවද ජාතික ලෙස තර්ජනයට භාජනය විය හැකි ශාක වර්ග දෙකක් ද, ආසන්න වශයෙන් තර්ජනයට ලක් වී ඇති ශාක වර්ග හතරක් ද මෙහිදී හමුවේ. මෙහිදී දැකගත හැකි ස්වාභාවික වාසස්ථාන මගින් විශේෂ ජෛව විවිධත්වයකට (උදා: කඩොලාන, වෙරළ තීරවල ඇති ලදු කැලෑ වැනි, වෙරළ සහ වෙරළ සම්බන්ද ගහ කොළ ආදිය) වාසස්ථාන සපයනු ලබයි.

2017 මාර්තු මස පමණ වන විටදී සීමාසහිත පාරිසරික පදනමට වාකරේ ප්‍රදේශයේ සල්ලතිවු දූපතෙහි “Leisure and Pleasure Pristine Eco Culture” නමින් සිදුකරමින් පවතින සංචාරක ව්‍යාපෘතියක් සම්බන්ධව තොරතුරු ලැබී ඇත. මෙහි ඇති සංවේදී පරිසරය හේතුවෙන්, සීමාසහිත පාරිසරික පදනම විසින් වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තු මඩකලපුව දිස්ත්‍රික් නිළධාරී සමග සම්බන්ධ වූ අවස්ථාවේදී පවසා ඇත්තේ මෙම ව්‍යාපෘතියට අදාළ අනුමැතිය මෙතෙක් ලැබී නැති බවයි. එනමුත්, එවකට මඩකලපුව දිස්ත්‍රික් ලේකම් පසුව පවසා ඇත්තේ මෙම ව්‍යාපෘතියේ පළමුවන අදියර බොහෝ දුරට අවසන් කර ඇති බවත් ඒ සදහා 2016 ජුනි මස දී මෙම ව්‍යාපෘතිය සිදුකිරීමට අනුමැතිය ලැබී ඇති බවත් ය.

මෙම අවස්ථාවේ දී, මෙම ව්‍යපෘතිය සම්බන්ධව වගකිවයුතු රජයේ බලධාරීන් විසින් 1981 අංක 57 දරණ වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනතේ අංක 14(1) සහ 14(2) යන වගන්ති (සංශෝධිත) මගින් වෙරළ කළාපයක් තුල කිසියම් සංවර්ධන ක්‍රියාවලියක් සිදුකිරීමට පෙර වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් නියමිත අවසරය ලබාගැනීමේ අවශ්‍යතාවය සම්බන්ධව සදහන් කර ඇති එම වගන්තින් නොසලකා හැර ඇත. මෙය වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් වෙරළ කලාපයන් තුළ සිදුවන සංවර්ධන කටයුතු මගින් ඇති වන සෘණාත්මක බලපෑම් අවම කිරීම සහ කළමනාකරණය කිරීමට යොදාගන්නා ක්‍රියාමාර්ගයකි. වෙරළ සංරක්ෂණ කළමනාකරණ සැලැස්ම (CZMP) මගින් සංචාරක කටයුතු සදහා යම් ඉදිකිරීමක් සිදුකිරීමට අවසර ලබාදීමට පෙර පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාවක් (EIA) හෝ මූලික පාරිසරික පරීක්ෂණයක් (IEE) සිදුකළ යුතු බව හදුනාගෙන ඇත. මෙම අවසර ලබාදීමේ ක්‍රියා පිළිවෙල ඕනෑම වෙරළ කළාපයකට සම්බන්ධ නියාමන යාන්ත්‍රණයකට අන්තර්ගත වූ ක්‍රියාවලියක් වන අතර, මෙය විශේෂයෙන්ම සංවේදී පරිසරයක පිහිටා ඇති සල්ලතිවු දූපතට සම්බන්ධ වේ. මේ නිසා, වෙරළ කළාපය තුල සිදුවන ඕනෑම සංවර්ධන කටයුත්තක් සැලකිලිමත්ව අධීක්ෂණය කළ යුතුය.

මෙම ව්‍යාපෘතියේ අවසරපත්‍රය පිළිබඳ තොරතුරු තහවුරු කරගැනීම සදහා සීමාසහිත පාරිසරික පදනම විසින් මඩකලපුව දිස්ත්‍රික් ලේකම් සමග දිගින් දිගටම ලිපි මගින් සම්බන්ධ විය. දිස්ත්‍රික් ලේකම් මගින් විවිධ පාර්ශවකරුවන් විසින් ඉදිරිපත් කර ඇති ලිපි සහ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශයේ අනුමැතිය ලත් සංශෝධිත අයවැයට අදාළ ලේඛන ද එවා තිබුනි. කෙසේවෙතත් මෙම ව්‍යාපෘතිය සදහා ඉඩම්

නිදහස් කිරීමට අදාළ අනුමැතිය ප්‍රාදේශීය ඉඩම් පරිහරණ කමිටුව මගින් ලබාදී නැත. මීට අමතරව, දිස්ත්‍රික් ලේකම් මගින් සකසන ලද අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්මට මධ්‍යම පරිසර අධිකාරිය (CEA) මගින් අපජලය උරාගැනීමේ වළවල් සහ ඒවා දූපත තුල ඉදිකරන ස්ථාන සම්බන්ධයෙන් සදහන් කර නොමැති නිසා අනුමැතිය ලබා දී නොමැත. මෙම ව්‍යාපෘතිය සිදුකිරීමට අවශ්‍ය අනුමැතිය හෝ අවසරය ලැබී නොමැති නමුත් මඩකලපුව දිස්ත්‍රික් ලේකම් විසින් මෙම ව්‍යාපෘතියේ කටයුතු සිදුකිරීමට කටයුතු කර ඇත්තේ මෙම ව්‍යාපෘතියේ කටයුතු සිදුනොවුනහොත් මෙම ව්‍යාපෘතියට අදාළව වෙන්කර ඇති අරමුදල් කපා හරිනු ඇත යන තර්කය අනුවත්, එසේනම් නැවත මේ ව්‍යාපෘතිය සිදුකිරීම සදහා නැවතත් අයදුම් කිරීමක් සිදුකල යුතුය යන හේතුන් මතය.

මෙමගින් පරිසරයට සිදුවන බලපෑම් නිරීක්ෂණය කිරීමෙන් පසුව, සීමාසහිත පාරිසරික පදනම ශ්‍රී ලංකාවට ප්‍රයෝජනවත් වන තිරසාරී සංචාරක කර්මාන්තයට ඉහල නැංවීම සදහා සිය සහයෝගය ලබාදෙමින්, මඩකලපුව දිස්ත්‍රික් ලේකම්වරයා හටද, වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවටත් මෙම ව්‍යාපෘතිය මගින් සිදු විය හැකි පාරිසරික සහ සමාජයීය ගැටළු නිරාකරණයට තම විශේෂඥය දැනුම බෙදාහදා ගැනීමටත් නිර්දේශ ඉදිරිපත් කිරීම සම්බන්ධව තම කැපවීම සදහන් කර තිබුණි. කෙසේ නමුත් මෙම ව්‍යාපෘතියේ ප්‍රගතිය නිරීක්ෂණය කිරීමෙන් පෙනී ගියේ මෙය පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තා (EIA) හෝ මූලික පාරිසරික පරීක්ෂණය (IEE) සම්පූර්ණයෙන්ම නොසලකා හැර සිදුකරන ලද ව්‍යාපෘතියක් බවට ය.

මෙම නීතිවිරෝධී සංචාරක ව්‍යාපෘතිය සම්බන්ධයෙන් වගකිව යුතු රාජ්‍ය ආයතන මගින් කිසිදු ක්‍රියාමාර්ගයක් නොගැනීම හේතුවෙන්, සීමාසහිත පාරිසරික පදනම විසින් 2018 මාර්තු මස 29 වැනි දින අභියාචනාධිකරණයට මහජන සුභසාධක නඩුකරයක් (CAW 143/2018) ගොනු කරමින් රිට් ආඥාවක් නිකුත් කරන ලෙස ඉල්ලා සිටින ලදී. මෙම නඩුව 2018 ජුලි මස 03 වැනි දින විනිසුරු පද්මන් සූරසේන මහතා සහ විනිසුරු අර්ජුන ඔබෙස්කර මහතා ඉදිරිපිට දී කරුණු තහවුරු කිරීම සිදුකළ අතර ඒ අනුව නොතිසි නිකුත් කිරීම සිදුකරන ලද අතර විනිසුරුවරුන් විසින් වගඋත්තරකරුවන් හට මීළග උසාවි දිනය තෙක් කිසිදු ඉදිකිරීම් කටයුත්තක නිරත වීම වැළැක්වීමට අතුරු තහනම් නියෝගයක් ලබාදී ඇත.

වෙරළ සංරක්ෂක සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව, මඩකලපුව දිස්ත්‍රික් ලේකම්, මධ්‍යම පරිසර අධිකාරිය, සංචාරක සංවර්ධන සහ ක්‍රිස්තියානි කටයුතු අමාත්‍යවරයා සහ අනෙකුත් වගකිවයුතු රාජ්‍ය ආයතන මෙම නඩුවේ වගඋත්තරකරුවන් ලෙස නම් කර ඇත.

පෙත්සම්කරුවන් වෙනුවෙන් විරාන් කොරයා මහතා සහ සරිටා දි ෆොන්සේකා මහත්මිය පෙනීසිටී.

නොතිසි මත කැඳවීම 2018 අගෝස්තු මස 6 වැනි දිනට යෙදී ඇත.